# ප්‍රාග් බෞද්ධ කුසල-අකුසල හා පුඤ්ඤ-පාප ඉගැන්වීම්

එච්. එම්. මහින්ද හේරත්

ආචාර ධර්ම අධ්‍යයනයේදී ප්‍රමුඛ ඉගැන්වීම් ලෙස කුසල-අකුසල හා පුඤ්ඤ-පාප ඉගැන්වීම් හඳුනාගත හැකිය. මෙම ඉගැන්වීම් හොඳ නරක වශයෙන් තේරුම් කරගත් ඒවා ප්‍රාග් බෞද්ධ යුගයේ පැවති ආචාර විද්‍යාත්මක සංදර්භයක භාවිත වූයේදැයි විමසීම මෙහි මූලික අපේක්ෂාවයි. බෞද්ධ දර්ශනයට පමණක් සීමා වූ කුසල-අකුසල ආචාර විද්‍යාත්මක ඉගැන්වීම් පූර්ව බෞද්ධ යුගයේදීත් විද්‍යමාන වූයේදැයි හඳුනාගැනීමක් මේ හා සමගාමීව සිදු වේ. මෙම කාල පරාසය ඉතාමත් පෘථුල වූයෙන් වෛදික යුගයේ සිට උපනිෂද් යුගය දක්වා විහිදී යන කාල පරිමාණය තුළ මෙම අධ්‍යයනය සිදු කෙරෙයි.

## වේදසාහිත්‍යාගත ඉගැන්වීම්

ස්වභාව ධර්මයේ අසිරිමත් අපරිමිත මහා බලවේග දේවත්වයෙහිලා සැලකූ ආදි වෛදිකයෝ යාග හෝමාදී ක්‍රියා මගින් තමන්ට අභිමත ප්‍රතිඵල ලබාගත හැකි බව විශ්වාස කළහ. මෙම ප්‍රතිඵල ඓහලෞකික වශයෙන්ද පාරලෞකික වශයෙන්ද අපේක්ෂා කළ හැකි බව ඔවුහු කල්පනා කළහ. පසුකාලයේ රූඪිගත වූ කර්මවාද පුනරුත්පත්ති හා පුනර්භව පිළිබඳ දියුණු අදහස් වෛදික සංහිතාවන්හි සඳහන් නොවන නමුත් ඊට තුඩුදුන් මූල සංකල්ප එම සංහිතාවයෙහි ගැබ්වී ඇති බව අනුමාන වශයෙන් සැලකිය හැකිය.[1] සූර්ය, වරුණ, යම, පිතෘ ආදි වෛදික සූක්ත මෙහිලා වැදගත් සාධක වේ.

මුල් යුගයේ සිට වෛදික ජනයා සොබාදහම තුළ ක්‍රියාත්මක වන අද්භූත ශක්ති විශේෂයන් කෙරෙහි සිය අවධානය යොමු කළේය. එය වටහා